පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
**Police Media Division**

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No: 517
දුරකථනය / தொலைபேசி / Telephone: 011-2384024, 011-2395605
ෆැක්ස් / தொலை நகல் / Fax: 011-2329500
වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site: www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E mail: dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No: 989 / 2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.07.08 පැය 0900

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ඉන්ධන ලබාගැනීමට පැමිණ සිටි දෙපිරිසක් අතර ඇති වූ ආරවුලකින් පුද්ගලයෙකු මියයාමක් - ගාල්ල වරාය පොලිස් වසම**

2022.07.08 වන අද දින පැය 0030ත් 0100 අතර කාලයේදී ගාල්ල වරාය පොලිස් වසමේ මාගල්ල ප්‍රදේශයේ පිහිටි ඉන්ධන පිරවුම් හලක ඉන්ධන ලබාගැනීම සඳහා පෝලිමේ රැදී සිටි දෙපිරිසක් අතර ඇතිවූ ආරවුලක් හේතුවෙන් තියුණු ආයුධ වලින් පහරදීමෙන් එක් පුද්ගලයෙකු මියගොස් ඇති අතර තවත් තිදෙනෙකු තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත්ව ප්‍රථිකාර ලබයි. දැනට අනාවරණය වන තොරතුරු අනුව දින කිහිපයක සිට ඉන්ධන ලබාගැනීම සඳහා නතර කර සිටි කාර් රථයක අයිතිකරු හමුවීමට ඔහුගේ යහලුවෙකුත්, යහලුවාගේ සහෝදරයා හා බිරිඳ පැමිණ ඇති අතර එම සිවුදෙනා තේ පානය සඳහා හෝටලයකට ගොස් නැවත පැමිණීමේදී නතර කර තිබූ කාර් රථය ඉදිරිපසින් තවත් කාර් රථයක් නතර කර තිබීම නිසා ඒ පිළිබඳව විමසීමට යාමේදී මෙම ආරවුල ඇතිවී ඇති බවට නිරීක්ෂණය වේ.

ඉන්ධන පිරවුම් හලේ සිට මීටර් 200 කට ආසන්න දුරකින් ගාල්ල උඩුගම මාර්ගයේ මෙය සිදුවීම සිදුව ඇති අතර මියගිය පුද්ගලයා පෝලිමේ රැදී සිටි කාර් රථයේ හිමිකරු හමුවීමට පැමිණ සිටි යහලුවා වන අතර කාර් රථයේ හිමිකරු හා ඔහුගේ සහෝදරයාත් තුවාල ලබා ඇත. පහරදුන් පාර්ශවයේ අයකුද තුවාල ලබා ඇති අතර පහරදෙන අවස්ථාවේ ඇතිවූ තත්ත්වයක් මත ඔහුද තුවාල ලබා ඇති බව පෙනීයයි.

**මරණකරු වයස අවුරුදු 25ක් වූ යටගල, වංචාවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පහරදීම සිදුකල සැකකරුවන් හඳුනාගෙන ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් මෝටර් රථයක්, ත්‍රිරෝද රථයක් හා යතුරුපැදියක් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් එම ප්‍රදේශයේම පදිංචිකරුවන් වන අතර අත්අඩංගුවට ගැනීම සඳහා ගාල්ල වරාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**